ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2152/65 - 2019 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා - 2019.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංක :* කේඩීඑස්/පීඩීබී/4/3/2/11.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/9/2015/ ඩබලිව්එස්/110.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, අළුත්ගම මහකුඹුරේ ගම්මැද්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක මහ/6917 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0212 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස්:

**කැබලි අංක 01**

ඉඩමේ නම: වුඩ්හෝප් වත්ත *නොහොත්* වුඩ්කෝප් වත්ත;හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්:රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0206

උතුරට: මු.පි.මහ 6536 හි 1 වැනි බිම් කැබැල්ල; නැගෙනහිරට: මු.පි. ඒ 1742 හි 107 වැනි බිම් කැබැල්ල සහ මෙම පිඹුරේ 2 වැනි බිම් කැබැල්ල; දකුණට: මු.පි. ඒ 1742 හි 127 වැනි බිම් කැබැල්ල; බටහිරට: මු.පි. ඒ 1742 හි 127 වැනි බිම් කැබැල්ල.

**කැබලි අංක 02**

ඉඩමේ නම: වුඩ්හෝප් වත්ත *නොහොත්* වුඩ්කෝප් වත්ත; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006

උතුරට: 1 වැනි බිම් කැබැල්ල සහ මු.පි.මහ 6536 හි 1 වැනි බිම් කැබැල්ල; නැගෙනහිරට: මු.පි. ඒ 1742 හි 107 වැනි බිම් කැබැල්ල; දකුණට: මු.පි. ඒ 1742 හි 107 හා 127 වැනි බිම් කැබැලි; බටහිරට: 1 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 පෙබරවාරි මස 06 වැනි දින පෙ.ව. 10.00ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020 ජනවාරි මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම, සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩබ්.එම්.ටී.ඩී.කේ. වීරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2019 දෙසැම්බර් මස 04 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

12-743

---

**සංශෝධනය**

**ඉඩම් අත්කරගැනීමේ පනත ( 460 පරිච්ඡේදය )**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ :* තිප්‍රාලේ/1/8/3/37අත්.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1823/71 හා 2013.08.16 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද බස්නාහිර පළාතේ "කොළඹ දිස්ත්‍රික්කයේ" තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළඹ මහනගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 45, නැගෙනහිර පාමංකඩ සහ බටහිර පාමංකඩ යන ග්‍රාම නිළධාරි වසම්වලට අයත් පාමංකඩ ගමේ පිහිටි 2013.06.28 දිනැති සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.කො. අංක 9345 මූලික පිඹුරේ කැබලි අංක 33, 53, 67 හා 68 හි සංශෝධනය මෙසේය.

1. 2019.09.30 දිනැති මූලික පිඹුර සංශෝධනය මගින් කැබලි අංක 33 අංක 76 හා 77 ලෙස අනු බෙදුමකින් වෙන්කර දක්වා ඇත;

**කැබලි අංක 76**
ඉඩමේ නම: වරිපනම් අංක 615 (කොටසක්) ශ්‍රී සම්බුද්ධ ජයන්ති මාවත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර 0.0057.

**කැබලි අංක 77**
ඉඩමේ නම: වරිපනම් අංක 615 (කොටසක්) ශ්‍රී සම්බුද්ධ ජයන්ති මාවත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර 0.0067.

02. 2019.09.29 දිනැතිව මූලික පිඹුරට සිදුකළ සංශෝධනය මගින් කැබලි අංක 53 හි වර්තමාන ඉඩම් පරිහරණය ගෙවත්ත සමග ස්ථිර ගොඩනැගිල්ලේ කොටසක් ද ඇතුළත් බව දන්වා ඇත.

03. 2019.07.29 දිනැති මූලික පිඹුරට සිදු කළ සංශෝධනය මගින් අංක 67 හා 68 යන කැබලි පිළිවෙලින් 74 හා 75 ලෙස සංශෝධනය කර ඇත:

**කැබලි අංක 74**
ඉඩමේ නම: වරිපනම් අංක 708 (කොටසක්) ශ්‍රී සම්බුද්ධ ජයන්ති මාවත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර 0.0027.

**කැබලි අංක 75**
ඉඩමේ නම: වරිපනම් අංක 708/1, ශ්‍රී සම්බුද්ධ ජයන්ති මාවත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර 0.0037.

ප්‍රියන්තා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2019 නොවැම්බර් මස 28 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

12 - 744

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.